# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 44 දරන
# ශ්‍රී ලංකා තේ මණ්ඩල
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 නොවැම්බර් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1990 නොවැම්බර් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි.    තැපැල් ගාස්තුව : රු. 1.00

[සහතිකය සටහන් කළේ 1990 නොවැම්බර් මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 52/89.

**1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1990 අංක 44 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **සංක්ෂිප්ත නාමය.**

2. 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා පිළිවෙළින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ, 5ආ සහ 5ඇ වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය:— **1975 අංක 14 දරන පනතේ 5අ, 5ආ සහ 5ඇ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.**

"තේ සභාව

5අ. (1) තේ වැවීම, නිෂ්පාදනය, විකිණීම, ප්‍රචාරය සහ අලෙවිය, අපනයනය සහ මූල්‍ය කට යුතු පිළිබඳව විශේෂයෙන් සැලකිල්ල යොමු කරමින් තේ කර්මාන්තය පිළිබඳව දැනීමක් සහ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතුරින් අමාත්‍ය වරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් විසි දෙනකුට නොවැඩි ගණනකින් යුක්ත වූ තේ සභාවක් (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) තිබිය යුතු ය.

(2) අමාත්‍යවරයා වෙත යවන ලිපියක් මගින් සභාවේ සාමාජිකයකු විසින් ඕනෑම වේලාවක තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් කවර හෝ වේලාවක කිසිම හේතුවක් නොදක්වා සභාවේ සාමාජිකයකු ඔහුගේ ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(4) මරණය, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා සභාවේ සාමාජිකයකු ධුරය හිස්කළ අවස්ථාවක අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනි මින් එම සාමාජිකයා වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය. එසේ පත්කරනු ලබන සාමාජිකයා තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(5) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැර ගොස් සිටීම හෝ වෙනත් හේතුවක් නිසා සභාවේ සාමාජිකයකුට ඔහුගේ කටයුතු ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

(6) (2) සහ (3) වන උපවගන්තිවල විධිවිධාන වලට යටත්ව සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු 3 ක් විය යුතු ය.

(7) කාලය ඉකුත්වීම නිසා ධුරය හිස්කරන සාමාජිකයකු නැවත පත්කිරීමට සුදුස්සෙක් වන්නේ ය.

(8) අමාත්‍යවරයා සභාවේ සාමාජිකයකු සභාවේ සභාපති වශයෙන් ද තවත් සාමාජිකයකු සභාවේ උප සභාපති වශයෙන් ද පත් කළ යුතු ය.

(9) අමාත්‍යවරයා වෙත යවන ලිපියක් මගින් සභාවේ සභාපතිවරයා හෝ උප සභාපතිවරයා විසින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(10) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා කවර හෝ වේලාවක සභාවේ සභාපතිවරයා හෝ උපසභාපතිවරයා ඉවත් කළ හැකි ය.

(11) සභාවේ සභාපතිවරයාගේ හෝ උප සභාපතිවරයාගේ ධුර කාලය ඔහු සභාවේ සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

(12) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා සභාවේ සභාපතිවරයාට ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් සාමාජිකයකු පත් කළ හැකි ය.

(13) සභාව විසින් එහි රැස්වීම් පිළිබඳව ද එම රැස්වීම්වල දී කටයුතු ඉටු කිරීම පිළිබඳව ද වූ කාර්ය පටිපාටිය විධිමත් කර ගත හැකිය.

සභාවේ කර්තව්‍ය.

5ආ. තේ වැවීම, නිෂ්පාදනය, විකිණීම හා නිෂ්පාදනය හා අපනයනය ඇතුළුව තේ කර්මාන්තය පිළිබඳ සියලුම අංශ ගැන අමාත්‍යවරයාට උපදෙස් දීම සභාවේ කර්තව්‍ය විය යුතු ය.

සභාවේ කාර්ය.

5ඇ. තේ කර්මාන්තයට අදාළව හෝ මේ පනතේ කාර්ය පරිපාලනය පිළිබඳව උපදෙස් සඳහා අමාත්‍යවරයා විසින් සභාව වෙත යොමු කරනු ලබන සියලු කාරණා පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සභාවේ කාර්යය විය යුතු ය:

එසේ වුවද කාරණය සභාවේ උපදේශය සඳහා යොමු කරනු ලැබ නොතිබුණද, තේ කර්මාන්තයේ යම් අංශයක් පිළිබඳව හෝ මේ පනතේ කාර්ය පරිපාලනය පිළිබඳව යම් නිර්දේශයක් කිරීමෙන් සභාව වළක්වන්නක් ලෙස මේ වගන්තියේ කිසිවක් කියවීම හෝ තේරුම් ගැනීම නොකළ යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.